**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

**පුවත්පත් නිවේදනය**

ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමා මහ මැතිවරණයේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ලබා ගත් විශිෂ්ඨ ජයග්‍රහණයට සුබ පැතීම සඳහා අද පස්වරුවේ අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා හමු විය. අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා මැතිවරණය සාර්ථකව පැවැත්වීම වෙනුවෙන් ශ්‍රී ලාංකික ජනතාවට සහ රජයට සිය ප්‍රසාදය පළ කළ බවද ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ලබාගත් මැතිවරණ ජයග්‍රහණයට සුභාසිංශන එක් කළ බවද මහ කොමසාරිස්තුමා සිහිපත් කළේය.

මහ කොමසාරිස්තුමා පුළුල් ද්විපාර්ශවික සහයෝගීතාවය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ නව රජය සහ පාර්ලිමේන්තුව සමඟ ඉතා සමීපව කටයුතු කිරීමට ඉන්දීය රජයේ දැඩි කැමැත්ත සහ කැපවීම අවධාරණය කළේය. මේ වෙනුවෙන් ශ්‍රී ලංකා නායකත්වයේ මඟ පෙන්වීම තවදුරටත් අපේක්ෂා කරන බව එතුමා ප්‍රකාශ කළේය. අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් හිමි කර ගත් ශක්තිමත් ජනවරම කොවිඩ්-19 වසංගතයේ හානිකර ආර්ථික බලපෑම් අවම කිරීම ඇතුළුව ද්විපාර්ශවික සහයෝගීතාවය ඉහළ නැංවීම සඳහා දෙරටට නැවුම් අවස්ථාවක් උදා කර දී ඇත.

***

කොළඹ

ශක වර්ෂ 1942 ශර්වන 17

2020 අගෝස්තු 8